# සංස්කාරකගෙන්



## නිෂ්පාදන වසරෙන් ජයකණුවක් කරා

1973 නිෂ්පාදන වර්ෂයත් සමඟ අපේ ජාතික දියුණුවේ නවෝදයක් උදාවිය. සිය වස් ගණනක් තිස්සේ විදේශීය බලපෑම් වලට ගොදුරුව සිටි අපි අද නැවතත් නිදහස් ස්වෛරී ජාතියක් බවට පත්ව සිටිමු. ඒ සමඟම එවැනි පූර්ණ නිදහසක මල් පල නෙලිය හැක්කේ ආර්ථික වශයෙන්ද නිදහසක් ලබාගතහොත් පමණක් බැව් නිතර අප විසින් සිහිකළ යුත්තකි.

මෙවන් උසස් අදහසක් පෙරදැරි කරගෙන කටයුතු කිරීමේදී අපේ විදේශ විනිමය වැය කරමින් ආනයනය කළ ආහාර බෝග අප රට තුළම නිපදවා ගැනීමේ අවශ්‍යතාවය ඉතා වැදගත් තැනක් ගනී. ස්වාභාවික පිහිටීම හා ජාතික ධන සම්පත් අනුව කෘෂිකාර්මික රටක් වූ ශ්‍රී ලංකා පොළොවෙන් අපට අවශ්‍ය හැම ආහාරයක්ම නිපදවා ගැනීමේ හැකියාව ඇත. අවශ්‍ය වනුයේ අපේ උනන්දුව හා උත්සාහය පමණි.

අපේ ආහාර නිෂ්පාදන ව්‍යාපාරයේ ප්‍රමුඛස්ථානය හිමි වනුයේ සහල් නිෂ්පාදනය සඳහාය. පසුගිය වසර කීපය තුළ මෙරට සහල් නිෂ්පාදනය පිළිබඳව ලැබූ ප්‍රගතියේ ප්‍රතිඵලයක් වශයෙන් දැනට අක්කරයකින් වී බුසල් 65 පමණ සාමාන්‍ය අස්වැන්නක් ලබාගැනීමට හැකිව ඇත. මේ ප්‍රමාණය බුසල් 100 දක්වා වැඩිකර ගත හැකි වුවොත් මීළඟ වසර කීපය තුළදී සහලින් ස්වයංපෝෂිත වීමට අපට අපහසු නොවනු ඇත. වැඩි අස්වනු දෙන නව වී වර්ග වගා කිරීම, රසායනික පෝර යෙදීම හා වල් පැල මර්දනය ආදී ක්‍රම අනුගමනය කළහොත් මේ අදහස මුදුන්පත් කර ගැනීමට කිසිදු අපහසුතාවයක් නොවනු ඇත.

මීළඟ වැදගත් ස්ථානය හිමිවනුයේ මෑතක් වන තෙක් අපේ විදේශ විනිමය කෙරෙහි තදින් බලපෑ ආහාර බෝග වන මිරිස්, ළූණු හා අර්තාපල් යන බෝග වලටය. මෙවැනි බෝග වලින් ස්වයංපෝෂිත විය නොහැකියයි කලකට පෙර ඇතැම් අය තුළ පැවති අවබෝධය දැන් ක්‍රමයෙන් තුරන් වී ඇත. ඊට හොඳම උදාහරණයක් වශයෙන් අර්තාපල් වගාව හැඳින්විය හැකිය. මෙරට අර්තාපල් වගා කළ නොහැකි යයි කලකට පෙර පැවති මතය දුරු කරමින් අපේ පොළව තුළින්ම නිපදවූ අර්තාපල් පමණක් කෑමට හැකි තත්ත්වයකට අද අපි පත්ව සිටිමු. එය අපේ විශාල ජයග්‍රහණයකි. ඒ අතර කලකට පෙර මිරිස් හා ළූණු පිටරටින් එනතෙක් බලා සිටීමට අපි පුරුදුව සිටියෙමු. රජය විසින් ළූණු හා මිරිස් ආනයනය නතර කිරීමත් සමඟ මෙම

බෝග වගා කිරීමට කවුරුත් පාහේ උනන්දු වූහ. එහි ප්‍රතිඵලයක් වශයෙන් අපේ ආහාරය පිණිස අප රට වගා කළ මිරිස් හා ළූණු පමණක් ප්‍රයෝජනයට ගැනීමේ වාසනාව අපට උදාවී ඇත.

අපේ විදේශ විනිමය කෙරෙහි බොහෝ දුරට බලපෑ දේ අතුරින් සීනි සඳහාද හිමි වනුයේ වැදගත් ස්ථානයකි. අපට අවශ්‍ය සීනි වලින් සෑහෙන ප්‍රමාණයක් ඉතා පහසුවෙන් නිපදවා ගැනීමේ හැකියාව අපට ඇත. ඒ නිසා ශ්‍රී ලංකා සීනි සංයුක්ත මණ්ඩලයේ වගාවනට අමතරව උක්වගාව සාර්ථක කළ හැකි පෙදෙස්වල ගොවීන් ඒ සඳහා දිරි ගැන්වීමට රජය ඉදිරිපත් වී සිටී. ඒ අනුව නුදුරු අනාගතයේදී අපේ සීනි වලින් වැඩි කොටසක් ශ්‍රී ලංකා පොළෝ රසයෙන් නිපදවෙන බවට කිසිදු සැකයක් නැත.

සුළු අපනයන බෝග, ස්ථිර වැවිලි කර්මාන්ත, එළවළු හා පළතුරු නිෂ්පාදන හා සත්ව පාලන කටයුතු නැංවීම සඳහාද රජයේ පස් අවුරුදු සැලැස්ම යටතේ හිමිවී ඇත්තේ විශේෂ ස්ථානයකි. ඒ සඳහා ජනතා සහයෝගය ලබාගැනීමටත් ඔවුන්ට අවශ්‍ය හැම පහසුවක්ම සැලසීමටත් රජය කටයුතු කර ගෙනයයි.

අපේ ගොවිතැනින් වැඩි නිෂ්පාදනයක් ගත හැක්කේ විද්‍යාත්මක ක්‍රම අනුගමණයෙන් බැව් අවිවාදයෙන් පිළිගත යුත්තකි. ඒ සඳහා විද්‍යාත්මක දැනුම ලබා දෙනු පිණිස විවිධ සේවාවන් ඇත. ඒ අතුරින් මුල් තැනක් ගනු ලබනුයේ ගොවිකම් ව්‍යාප්ත සේවයයි. ශ්‍රී ලංකාවේ සෑම දිස්ත්‍රික්කයම ව්‍යාප්ති කටයුතු භාර දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරිවරුන් හා ප්‍රාදේශීය මට්ටමේ කෘෂිකර්ම උපදේශකවරුද සේවය කරති. මේ හැරුණු විට ගොවි ජනතාව සමග නිතර කිට්ටුවෙන් කටයුතු කරන කෘෂිකර්ම ව්‍යාප්ති සේවකවරු ගැමි මට්ටමේ සේවය කරති. මේ නිලධාරීන් නිතර ඔබේ සේවය සඳහා සූදානමින් සිටින අතර, ගැමි මට්ටමේ නිලධාරීන් සමග කිට්ටු සම්බන්ධතාවයකින් කටයුතු කිරීම වඩා පහසුමෙන්ම ඔබට ප්‍රයෝජනවත් වන බැව්ද නැවත වරක් මතක් කරනු කැමැත්තෙමු.

සහල්, කිරි, බිත්තර, අතිරේක ආහාර හා සීනි නිෂ්පාදනය පිළිබඳව පසුගිය කලාප වලින් පාඨකයාගේ අවධානය යොමු කළෙමු. මේවර අප පාඨකයින් නිෂ්පාදන වර්ධය කෙරෙහි යොමුකරවනු කැමැත්තෙමු. අපේ පැරණි මුතුන් මිත්තන්ගේ ඇට කටු වලින් සාරවත් වූ වටිනා මිණි-මුතු හමුවන මේ සිරි ලක් පොළවේ අපට අවශ්‍ය හැම බෝගයක්ම සාරවත්ව වගාකළ හැකිය. අපේ අතීතය ඊට දෙස් දෙයි. අවශ්‍ය වනුයේ අපේ දෑත-දෙපය වෙහෙසීමය. මේ අදිටන මුල්කරගෙන අප කවුරුත් වැඩ කළොත් 1973 අවසානයේදී අපේ ආහාර නිෂ්පාදනයේ හා ආර්ථික තත්ත්වයේ තවත් ජය කණුවක් කරා ළඟාවීමට අපට හැකිවන බවට කිසිදු සැකයක් නැත.

ගොවිකම් සඟරාවේ පළ කිරීම සඳහා සලකා බැලීමට එවන සියලුම ලිපි ඉතා පිරිසිදුව තනි පිටේ ලියා එවන ලෙසත් ඒවා තමන් විසින්ම ලියන ලද බවට සහතික කර එවන ලෙසත් ඉල්ලා සිටිමු.